***Social Security Contribution Levy***
***Lecturer: Nuwan Sameera***

## සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)




### **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද** (SSCL)

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL), 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත (පනත) මගින් 2022 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි පනවනු ලැබේ. සෑම ලියාපදිංචි පුද්ගලයෙක්ම උපචිත පදනමක් මත බද්ද සඳහා ගිණුම් තැබිය යුතුය.

### **බද්දට යටත් විෂය පථය**

සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද,

- යම් ද්‍රව්‍යයක් ආනයනය කරනු ලබන
- යම් ද්‍රව්‍යයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් කරනු ලබන
- ඕනෑම ස්වභාවයකට අයත් සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරනු ලබන
- 2 වන අයිතමයේ සඳහන් නිෂ්පාදකයකු වන්නා වූ තැනැත්තකු විසින් සිදු කරන විකිණීමක් හැර, යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළු එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් කරනු ලබන

බදු අය කළ හැකි සෑම තැනැත්තෙකු විසින්ම (පුද්ගලයකු හෝ අස්තිත්වයක් අදහස් වන අතර, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක්, පොල්මංකරුවෙක්, රාජ්‍ය නොවන සංවිධානයක් සහ පුණ්‍යායතනයක්) ගෙවිය යුතුය.

### **පිරිවැටුම**

සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත අදාළ වන තැනැත්තන්ගේ අදාළ කාණ්ඩයට අදාළව පිරිවැටුම පහත පරිදි අර්ථ දක්වා ඇත:-

- **යම් භාණ්ඩයක් ආනයනය කිරීම සම්බන්ධයෙන්** – 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය යටතේ එකතු කළ අගය මත බද්දේ කාර්ය සඳහා නිශ්චය කරන ලද එම ද්‍රව්‍යයේ වටිනාකම අදහස් වන නමුත් පළමුවන උපලේඛනයේ 1අ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක වටිනාකම ඇතුළත් නොවේ.

- **යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන්** – පළමු උපලේඛනයේ 1අ කොටසේ දක්වා ඇති යම් නිදහස් කරන ලද ද්‍රව්‍යයක් හැර, එකී තැනැත්තා විසින් යම් ද්‍රව්‍යයක් ශ්‍රී ලංකාව තුළදී නිෂ්පාදනය කර විකිණීමෙන් එකී කාලපරිච්ඡේදය තුළ ලැබිය යුතු මුදල, එම මුදල ලැබුණේ වුව ද, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ.

JMCvLearning "your virtual learning partner"

*Social Security Contribution Levy*
*Lecturer: Nuwan Sameera*

- 
- **ඕනෑම ස්වභාවයක සේවාවක් සැපයීම සම්බන්ධයෙන් -**
    1. පළමු උපලේඛනයේ II කොටසෙහි සඳහන් කර ඇති නිදහස් කරන ලද සේවාවන් හැර ශ්‍රී ලංකාවේ යම් මූල්‍ය සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ කිසියම් මූල්‍ය සේවාවක් සැපයීමෙන් ලැබුණේ වුවද නොලැබුණ් වුවද ලැබිය යුතු මුදල.

    2. පළමු උපලේඛනයේ II වන කොටසේ දක්වා ඇති නිදහස් කරන ලද සේවාවන් හැර, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5 වැනි වගන්තියේ (7) උපවගන්තිය යටතේ නිශ්චිතව ගණනය කරන ලද, යම් දේපළ වෙළදාම් සහ වැඩි දියුණු කිරීමේ ව්‍යාපාරයකින් පැන නගින ඕනෑම සේවාවක වටිනාකම;

    3. ඉහත a. සහ b. හි සඳහන් සේවා සහ නිදහස් සේවා හැර ශ්‍රී ලංකාවේ ඕනෑම සේවාවක් ශ්‍රී ලංකාව තුළ සැපයීම මගින් ලැබුණේ වුවද නොලැබුණ් වුවද ලැබිය යුතු මුදල.

- **යම් ද්‍රව්‍යයක් ආනයනය කිරීම සහ විකිණීම ඇතුළුව එවැනි ද්‍රව්‍යයක තොග හෝ සිල්ලර වෙළදාමේ ව්‍යාපාර සම්බන්ධයෙන්** – පහත සඳහන් නිදහස් කිරීම් හැර, යම් ද්‍රව්‍යයක් තොග වෙළදාමෙන් හෝ සිල්ලර වෙළදාමෙන් ලැබුණේ වුව ද නොලැබුණේ වුව ද ලැබියයුතු මුදල,
    1. ඖෂධීය ද්‍රව්‍ය;

    2. 2007 අංක 48 දරන විශේෂ වෙළද භාණ්ඩ බදු පනතේ විධිවිධාන යටතේ වන විශේෂ වෙළද භාණ්ඩ බද්දට යටත්වන යම් ද්‍රව්‍යයක්, විකිණීම සඳහා සකස් කිරීම හැර යම් පිරිසැකසුම් කිරීමක් නොකොට එම භාණ්ඩයේ ආනයනකරු විසින් විකුණනු ලබන අවස්ථාවකදී එම ද්‍රව්‍යය;

    3. අපනයනය කරනු ලබන යම් ද්‍රව්‍යයක්;

    4. ඉන්ධන පිරවුම්හලක විකුණනු ලබන පෙට්‍රල්, ඩීසල්, හෝ භූමි තෙල්;

    5. එල්. පී. ගෑස්; සහ

    6. යම් දේශීය නිෂපාදකයකුගෙන් හෝ දේශීය නිපදවන්නකුගෙන් මිල දී ගනු ලබන නැවුම් කිරි, අමු පත්‍ර, කුරුඳු හෝ රබර්( රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්).

  යම් බදු අයකළ හැකි තැනැත්තෙකුගේ අදාළ කාතර්‍රුව සඳහා නිශ්චිතව දක්වා ඇති පිරිවැටුමට;

a. එම කාතර්‍රුවේ දී එකී තැනැත්තා විසින් දරන ලද යම් බොල් ණය ඇතුලත් නොවිය යුතුය. (එසේ වුව ද, යම් අදාළ කාතර්‍රුවක් තුළ ආපසු අයකරගන්නා ලද යම් බොල් ණයක් එම අදාළ කාතර්‍රුවේ පිරිවැටුම සඳහා ඇතුළත් කරගනු ලැබිය යුතුය.)

b. යම් එකතු කළ අගය මත බදු ගෙවීමක් (ලියාපදිංචිව ඇත්නම්)

JMC Learning
"your virtual learning partner"

c. අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ජාත්‍යාන්තර ඉසව්වක් සම්බන්ධයෙන් අපනයනය සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවන ලද යම් ප්‍රදානයක් ඇතුලත් නොවිය යුතුය.

**ලියාපදිංචි වීමේ සීමාව –**

- 2021.10.01 දින සිට 2022.09.30 දින දක්වා වූ මාස දොළහක කාලසීමාව ඇතුලත රු. 120,000,000 ඉක්මවන සමස්ත පිරිවැටුමක් සහිත වීම
- 2022.10.01 දිනයෙන් හෝ එදිනට පසු ආරම්භ වන යම් කාතර්‍ුවක් සඳහා සමස්ත පිරිවැටුම රු. 30,000,000 ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්නම්.

**බදු ගෙවිය හැකි කාලය**

බද්දට යටත් පිරිවැටුම මත සෑම බදු අය කළ හැකි තැනැත්තෙකුගෙන්ම 2022 ඔක්තෝම්බර් 01 වන දින හෝ එදිනට පසු සෑම කාතර්‍ුවක් සඳහාම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය.

**බදු අනුපාතය**

බද්දට යටත් පිරිවැටුම මත 2.5% ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පහත දැක්වෙන ආකාරයෙන් ගෙවිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1 | යම් භාණ්ඩයක් ආනයනය කිරීම | | පිරිවැටුමෙන් 100% |
| 2 | යම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම | | පිරිවැටුමෙන් 85% |
| 3 | සේවාවක් සැපයීම | | |
| | (a) | මූල්‍ය සේවා සැපයීම | එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ වගන්තිය යටතේ නිකුත් කළ ගැසට් නිවේදනයේ දක්වා ඇති මූල්‍ය සේවාවන්ට ආරෝපණය වන අගය එකතු කිරීමෙන් 100% |
| | (b) | ඉඩම් හා වැඩිදියුණු කිරීම් | පිරිවැටුමෙන් 100% {2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 5 වන වගන්තියේ 7 වන උපවගන්තියේ දක්වා ඇති වැඩිදියුණු කිරීම් වල වටිනාකම (විකුණුම් වටිනාකම - විකුණනු ලබන දිනට හිස් ඉඩමේ වෙළඳපොල වටිනාකම)} |

JMC vLearning
"your virtual learning partner"

| | | | |
|---|---|---|---|
| | (c) | (a) සහ (b) අයිතමයන්ට අදාළ නොවන සේවා | පනතේ 3(2) (c) (iii) යටතේ සඳහන් පිරිවැටුමෙන් 100% |
| 4 | | | |
| | | | |
| | තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම | | |
| | (a) | යම් භාණ්ඩ ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන්නෙකු හෝ නිපදවන්නකුට අදාල ලියාපදිංචි බෙදාහරින්නෙකු විසින් යම් ද්‍රව්‍යයක් විකිණීම | පනතේ 3 (2) (ඇ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 25% ක් |
| | (b) | ආනයනය කිරීම සහ විකිණීම ඇතුළුව ඉහත (අ) අයිතමයට අදාළ නොවන තොග වෙළඳාම හෝ සිල්ලර වෙළඳාම | පනතේ 3 (2) (ඇ) වගන්තියේ සඳහන් පිරිවැටුමෙන් 50% ක් |

JMC vLearning
"your virtual learning partner"

**ස්වතක්සේරු පදනම මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීම.**

ස්වතක්සේරු පදනම මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මාසිකව ගෙවිය යුතුය. ගෙවීම් සිදු කළ යුතු දිනයන් පහත පරිදි වේ.

| මාසය | ගෙවීම් දිනය |
|---|---|
| කාර්තුවක පළමු මාසය සඳහා | අදාළ කාතර්‍ුවේ දෙවන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර |
| කාර්තුවක දෙවන මාසය සඳහා | අදාළ කාතර්‍ුවේ තුන්වන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර |

| | |
|---|---|
| කාර්තුවක තුන්වන මාසය සඳහා | අදාළ කාතර්‍ුව අවසානයේ ඉන් ඉක්බිතිව වහාම එළඹෙන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර |

## සමාජ ආරක්ෂණ දායකත්ව බදු වතර්‍ා

ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තෙකු විසින්ම අදාළ එක් එක් කාතර්‍ුව අවසානයෙන් පසු එළඹෙන මාසයේ විසිවන දින හෝ එදිනට පෙර සෑම කාතර්‍ුවක් සඳහාම ලිඛිත වාතර්‍ාවක් කොමසාරිස් ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතුය.

**වාතර්‍ා ඉදිරිපත් කළ යුතු දිනය :**

- අදාළ කාර්තුවක අවසානයෙන් පසු එළඹෙන මාසයේ 20 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කළ යුතුය.

**භාරදිය යුත්තේ :**

- ගොනුව වෙන් කර ඇති දේශීය ආදායම් දෙපාතර්මේන්තු නගරබද/ප්‍රාදේශීය කායර්ාල වෙත භාර දිය යුතුය.

- අනෙකුත් අංශ වලට අයත් නම් දේශීය ආදායම් දෙපාතර්මේන්තුවේ ප්‍රධාන කායර්ාලයේ පිහිටා ඇති මධ්‍ය ලේඛන කළමනාකරණ අංශය (CDMU) වෙත භාර දිය යුතුය.

## යොමුව

- 2022.09.21 දිනැති අංක PN/SSCL/2022-01 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ක්‍රියාත්මක කිරීමට අදාල දැන්වීම
- 2022.10.07 දිනැති අංක PN/SSCL/2022-02 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි කිරීමට අදාල දැන්වීම

*Source: IRD website*

JMC vLearning
"your virtual learning partner"